# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,915 - 2015 මැයි මස 15 වැනි සිකුරාදා - 2015.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 792 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 792 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 797 |


*සැ. යු.-* ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, සහ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 05 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

791 - B 80948— 5,302 (2015/05 )
F 1 –

# තනතුරු ඇබෑර්තු

**බියගම ප්‍රාදේශීය සභාව**

බියගම ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුර සඳහා විවෘත බඳවා ගැනීමට අදාලව 2015.04.24 දිනැති *ගැසට් පත්‍රයේ* පලකරන ලද නිවේදනයේ අධ්‍යාපන සුදුසුකම් සංශෝධනය කිරීම.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 01. ආදායම් පරීක්ෂක III පන්තිය | 04 | 1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ 2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |

ඉහත සංශෝධනය කරන ලද ආදායම් පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනය 2015.05.28 වැනි දක්වා දීර්ඝ කර ඇත.

වසන්ති වික්‍රමරත්න,
ලේකම්,(වැ.බ.)
බියගම ප්‍රාදේශීය සභාව,
දෙල්ගොඩ.

05-372

---

# පළාත් පාලන නිවේදන

**මහරගම නගර සභාව**

නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරයේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාල දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2015 අප්‍රේල් මස 23 වැනි දින,

| | | |
|---|---|---|
| පාරේ නම | : | පන්නිපිටිය, රුක්මලේ, හොරහේන පාර වරිපනම් අංක 93/3 සිට 93/11 දරන නිවාස පිහිටි මාර්ගය |
| දිග | : | මීටර් 53.5 |
| පළල | : | මීටර් 4.6 |
| | | වාහන හැරවුම් වෘත්තය මීටර් 9.0 |
| ආරම්භය | : | හොරහේන පාර |
| අවසානය | : | ව. අ. 93/7 |

| *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* |
|---|---|
| එන්. මුහන්දිරම් මිය | එච්. සිරිසේන මයා |
| පී. චන්ද්‍රලතා මිය | ඊ. රණසිංහ මයා |
| පී. ලලිතා මිය | ඩබ්. ප්‍රේමතිලක මයා |
| | ආර්. එච්. එස්. ප්‍රේමලාල් මයා |

| | | |
|---|---|---|
| පාරේ නම | : | බොරැල්ල කොට්ටාව ප්‍රධාන පාරට මුහුණලා 174 පාර, බුද්ධික හාඩ්වෙයාර් අසලින් යන පාර |
| දිග | : | අඩි 250 |
| පළල | : | අඩි 15 |
| ආරම්භය | : | ව. අ. 138 |
| අවසානය | : | ව. අ. 136/3C |

| *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* |
|---|---|
| ගයාදාස පරනවිතාන මයා | රූපිකා වැවගේ මිය |
| එච්. එස්. වී. විජයතිලක මයා | කේ. ඉන්ද්‍රානි පෙරේරා මිය |
| ජී. පී. සුරංග සුජිත් අපෝන්සු මයා | පී. සිරිල් සෙනවිරත්න මයා |
| | චන්දිම ජීවක ඩයස් මයා |

| | | |
|---|---|---|
| පාරේ නම | : | කොට්ටාව අතුරුගිරිය පාර, සාම මාවත පළමු අතුරු මාර්ගය (ව.අ.127/22,127/16,127/14,127/11,127/23 දක්වා මාර්ගය) |
| දිග/පළල | : | මීටර් 57.0 මීටර් 4.5 |
| | | මීටර් 25.0 මීටර් 3.0 |
| | | මීටර් 16.5 මීටර් 3.1 |
| | | වාහන හැරවුම් වෘත්තය මීටර් 9.0 |
| ආරම්භය | : | සාම මාවත, කොට්ටාව |
| අවසානය | : | ව. අ. 61/12 |

| *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* |
|---|---|
| ඩී. ඩී. සේනානායක මයා | ඩබ්. ආරියරත්න මයා |
| ඩී. ජී. සේනානායක මයා | එස්. ඒ. ඩී. සී. පී. දිසානායක මයා |
| ඩී. මුතුබනණ්ඩා මයා | එස්. රත්නවීර මිය |
| එච්. ඒ. ටී. එම්. ෆොන්සේකා මිය | |

05-298

## 2014.12.12 දින පළ වූ *ගැසට් පත්‍රයේ* 2722 පිටුවේ සංශෝධනයකි

**උපලේඛනය 05**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභා

**2015 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම**
***(ඇතැම් වෙළඳාම් සම්බන්ධයෙන් වූ බද්ද)***

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.-9-5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද එම කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/1

---

## 2014.12.12 දින පළ වූ *ගැසට් පත්‍රයේ* 2726 පිටුවේ සංශෝධනයකි.

**උපලේඛනය 06**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

**2015 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/2

---

## 2014.12.12 දින පළ වූ *ගැසට් පත්‍රයේ* 2727 පිටුවේ සංශෝධනයකි

**උපලේඛනය 07**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
**2015 වර්ෂය සඳහා ප්‍රචාරණ දැන්වීම්, දෘෂ්‍ය පරිසරය සඳහා ගාස්තු අය කිරීම**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/3

**2014.12.12 වැනි දින පළ වූ ගැසට් පත්‍රයේ 2728 පිටුවේ සංශෝධනයකි**

උපලේඛනය 08

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
2015 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු සහ පරීක්ෂණ ගාස්තු අය කිරීම.

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/4

---

**2014.12.12 වැනි දින පළ වූ ගැසට් පත්‍රයේ 2730 පිටුවේ සංශෝධනයකි.**

උපලේඛනය 11

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම - 2015

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඒ අනුව පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ගලබඩගම ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීම සඳහා පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2015.01.01 වැනි දින සිට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/5

---

**2014.12.12 වැනි දින පළ වූ ගැසට් පත්‍රයේ 2731 පිටුවේ සංශෝධනයකි**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම - 2015

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-12 යටතේ සභා සම්මත කරනු ලැබූ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාවට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් වයඹ පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වෙත පැවරී ඇති බලතල යටතේ වයඹ පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය තුමා විසින් අනුමැතිය දෙන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/6

**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අයකිරීම - 2015

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/7

---

**2014.12.12 වැනි දින පළ වූ ගැසට් පත්‍රයේ 2732 පිටුවේ සංශෝධනයකි**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

ඇතැම් ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2015

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 3.II.9-14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලිවේරා ගුණතිලක,
සභාපති,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

05-352/8

---

**බෙන්තොට ප්‍රාදේශීය සභා**

සම්මත අතුරු ව්‍යවස්ථා

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බෙන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2014.12.15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සම්මත කරන ලද පහත උපලේඛනයේ සඳහන් අංක 02.1 දරන යෝජනාව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

"1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික් සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල 1 සිට 29 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බෙන්තොට ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය."

ගයාන් ක්‍රිෂාන්ත සිරිමාන්න,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 15 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-255

# විවිධ දැන්වීම්

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2015 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ පෙබරවාරි මස 19 දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ-19 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ඒ වෙළඳ බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 19 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

**යෝජනාව**

2014.12.19 දිනැති අංක 1894 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ ඇති අන්තරාදායක ව්‍යාපාර, අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලේඛනයට වැඩිමනත් වශයෙන්, අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙස හඳුනාගත් පහත සඳහන් ව්‍යාපාර හා කර්මාන්ත සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2015 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01 | තේ කඩ/කෝපි කඩ පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03 | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04 | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | ලැගුම්හලක් හා රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | ගව පට්ටියක් හා කිරි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | මාළු වෙළෙඳාම හා ශීතකළ මාළු | 500 0 | 750 0 | 1,000 0 |
| 09 | මස් වෙළෙඳාම හා ශීත කළ මස් | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | කුකුළු හා ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | රස කැවිලි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | එළවළු හා පළතුරු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13 | සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම : | | | |
| | ග්‍රාමීය | 300 0 | 500 0 | 750 0 |
| | නාගරික | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | ඝාතන මඩු පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ නම් ද නැතහොත් අනුමත කළ හෝ පිළිගෙන ඇත්තේ නම් ද අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව වන්නේ එකී ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආදායම අනුව එම ආදායමෙන් 1%ක ගාස්තුවකි.

05-257

**බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව**

වෙනත් ගාස්තු අයකිරීම

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2015 වසර සඳහා පනවා 2015.01.01 සිට අය කිරීමට 2014.11.04 දින විශේෂ සභා රැස්වීමේදී තීරණය කරන ලද බැව් දැනුම් දෙමි.

ගාස්ත්‍රවේදී උක්වත්තේ චන්දිම හිමි,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 04 වැනි දින,
ගාල්ල, කලේගාන,
බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. | ඒ. ටී. පෝරම(ඔප්පු සාරාංශ පෝරම) ගාස්තු | 200 0 |
| 2. | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු | |
| | 1. කොස් ගසක් සඳහා | 300 0 |
| | 2. වෙනත් ගසක් සඳහා | 100 0 |
| 3. | වරිපනම් සහතික ගාස්තු (වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 300 0 |
| 4. | ඔප්පු සාරාංශ පත්‍ර ලේඛනයේ ඇතුලත් කිරීම සඳහා | 50 0 |
| 5. | ජල සහතික ගාස්තු/විදුලි වෙනත් | 200 0 |
| 6. | වරිපනම් ලේඛනයේ උද්‍ෘතපිටපත් නිකුත් කිරීම එක් වර්ෂයකට | 25 0 |
| 7. | කේ. පෝරම නැවත නිකුත් කිරීම | 50 0 |
| 8. | සහතික පිටපත් ගාස්තු (එක් වර්ෂයකට සෙවීමේ ගාස්තු) | 50 0 |
| 9. | රැස්වීම් ශාලාව බදු දීම (එක් දිනකට) | 1,500 0 |
| 10. | ජේ. සී. බී. යන්ත්‍රය සේවයේ යෙදවීම (පැයකට) | 2,100 0 |
| 11. | ජලනල එළීම සඳහා පාරවල් පළුදු කිරීමේ ගාස්තු | රු. ශත |
| | 1. එක් පැත්තක වර්ගමීටර් 1ක 1(m) x1(m) වළක් තැනීමේ දී පමණක් | 1,250 0 |
| | 2. අවම 3(ප) ක නලය එළීමේදී 0.3(m)x3(m) මාර්ග පලුදු කිරීම සඳහා (තාර සඳහා) | 1,300 0 |
| | (කොන්ක්‍රීට් සඳහා) | 1,750 0 |
| | 3. වැඩිවන සෑම දික් 1(ප) ක් අය කිරීම (තාර) | 435 0 |
| | අය කිරීම (කොන්ක්‍රීට්) | 600 0 |
| 12. | ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමේ දී අවසර ලබාදීමේ ගාස්තු දිනකට | 250 0 |
| 13. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |
| 14. | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට | 1 0 |
| 15. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම | 25 0 |
| 16. | ලබුදූව වෙළඳ සංකීර්ණයේ බදු අයිතිය වෙනස් කිරීම | |
| | 1. පහළ කඩ කාමර සඳහා | 1,00,000 0 |
| | 2. ඉහළ කඩ කාමර සඳහා | 50,000 0 |
| 17. | ට්‍රැක්ටරය කුලියට දීම (එක් දිනකට) | 3,000 0 |
| 18. | වෙන්දේසි ඉඩම් සඳහා පාරිසරික නිර්දේශය ලබාදීමේ පරීක්ෂණ ගාස්තු | |
| | ඉඩමේ වටිනාකම (ඉඩම් ඔප්පුව ප්‍රකාරව) | පරීක්ෂණ ගාස්තු රු. .ශ. |
| | 1. රු. 2,50,000 - හෝ ඊට අඩු වන විට | 1,000 0 |
| | 2. රු. 2,50001-සිට රු. 5,00,000 දක්වා | 3,000 0 |
| | 3. රු. 500,,001 සිට රු. 10,00,000දක්වා | 5,000 0 |
| | 4. රු. 1,00,000 ට වැඩි | 8,000 0 |
| 19. | වතුර බවුසරය කුලියට දීම (ජලය රහිතව) | 2,250 0 |
| | දිනක් රඳවා ගැනීම වෙනුවෙන් | 500 0 |
| | (දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැකිය) | |
| 20. | ප්ලේට් කම්පන යන්ත්‍රය (රෝලරය) කුලියට දීම පැය 8ක් (වැඩිවන සෑම කි.මී. සඳහා රු. 55) | 4,025 0 |
| | (දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක) | |
| 21. | ඩබල්ඩ්‍රම් කම්පන තලනය කුලියට දීම (පැය 8ක කාලයකට) | 4,200 0 |

05-419

---

**වෙරුගල් ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු - 2015

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1695 දරන 2011 පෙබරවාරි මස 25 වැනි දිනැති ගැසට් නිවේදනයේ IV(ආ) වැනි කොටසේ විවිධ දැන්වීම් පිටු අංක 722 සිට පිටු අංක 727 දක්වා උපවගන්ති I සිට VIII දක්වා පළ කරන ලද ගාස්තුන් 2015 ජනවාරි මස 01 වැනි දින සිට අය කරන බව මෙහි පිටු අංක 726 හි සඳහන් කර ඇති බෝට්ටු මගින් ප්‍රවාහනය කරන පාපැදි සහ යතුරු පැදි වලට අයකරන ගාස්තු අවලංගු කර එම සේවය නොමිලේ ලබා දෙන බවද 2015.04.10 වැනි දින පැවැති රැස්වීමේදී අංක 04 යෝජනාව අනුව සම්මත කර ඇති බව දැනුම් දෙමි.

එස්. විජයකාන්ද්,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
වෙරුගල්,
ඊච්චලම්පත්තු,

05-271

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.